# එක්-පා-ඇපාගෙ නමට වලක් තෑගි දෙඬ්ඬැයි එක්-පා-වල, එප්පාවල නමින් පතළ වෙඬ්ඬැයි

ආචාර්ය
සේන නානායක්කාර

අප දන්නා හැම ගමකට ම මොකක් හෝ නමක් ඇත. ගමක් වෙතොත් නමක් ඇති බවත්, ඒ නමට අගක් මෙන්ම මුලක් ද ඇති වග ත් ඉන්තේරුවෙන්ම කිව හැකි යැයි පැරැන්නන් කියන්නේ එබැවිනි. මෙහි ඉන්තේරුවෙන් යනු ස්ථිරව ම හෝ නිශ්චිතව ම යන අදහස යි. මුලක් යනු මූලාශ්‍රය කි. එය නිධාන කතාවක් ද විය හැකි යි.

මේ හැම ගමක් ම එකක් යැයි සම්මත හේතුවක් නිසා ඇති වූවක් නොවේ. ඒ ඇසුරු කොටගෙන මතු වූ රසවත් පුරාවෘතයන් හා ප්‍රවාදයන් බොහෝ ය. එහි නම එලෙස එන්නට ඇත්තේ හාත්පස පරිසරයෙහි දක්වෙන යම් භෞතිකමය විශේෂතාවක් හේතුවෙන් වන්නට පුළුවන. නැත්නම් එහි වසන්නන්ගේ වෙසෙස් ගති පැවතුම් සිරිත් විරිත් හා ක්‍රියා පටිපාටීන් නිසා විය හැකි යි. එසේත් නැත්නම් වෙනත් හේතුවක් නිසා ද විය හැකි යි.

මේ කුඩා ලිපියෙන් මා සැලකිල්ලට බඳුන් කරන්නේ එප්පාවල නම් වූ ග්‍රාම නාමය පිළිබඳව යි. එහි අලගිය මුලගිය තැන් සොයා බැලීම වූ කලී පෙර කල එහි විසූ ගැමියාගේ සිතුම් පැතුම්, විශ්වාස, සිරිත් විරිත් හා චර්යාවන් විග්‍රහ කෙරෙන සමාජ සමීක්ෂණයක් ද විය හැකි යි. කොටින් ම අපේ උංගේ වංහුං වහං නොකොට කියාපෑම නම් රසය දනවන්නක් ම වෙයි.

එප්පාවල පිහිටා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ය. අනුරාධපුරය - මහනුවර පාරේ පසළොස්වන මයිලය අතර පිහිටි මෙය, මේ වනවිට ජනගහනයෙන් යුතු, දියුණු වෙමින් පවත්නා ප්‍රදේශය කි. එප්පාවල යන නම මෙයට ලැබුණේ කෙසේදැයි නිශ්චිතව ම කියන්නට හැකි අයෙක් නැති වුව ද ඒ සම්බන්ධ ප්‍රචලිත ප්‍රවාද කිහිපයක් වේ. දෙකක් ඉන් ප්‍රධාන ය. මේ ගැන කරුණු කියාදුන් ගැමියන්ගේ අදහස් කිහිපයක් මෙලෙස සටහන් කළ හැකි යි.

මේ පළාත පිහිටල තියෙන්නෙ අනුරාධපුරේට යි විජිතපුරේට යි අතරෙ. එළාර දුටුගැමුණු යුද්දෙට ත් ඉස්සරවෙලා තමයි මේ සංගදිය වෙලා තියෙන්නෙ. ඒ කාලෙ යුද්ද සේනා සකසුරුවං කරනුඩ බාරදීල තිබුණෙ ඇපාවරු කියල කොටහකට. මේ යුද්දෙ දිනවන්ඩ එවුන්දලා දිවිහිමයෙං හටං කරල තියෙනවා. ඉතිං ඔය අතරවාරෙ යුද්දෙදි එක ඇපා කෙනෙක්ගෙ කකුලක් කැඩුණලු. ඊට පස්සෙ එවුන්දට තිබුනෙ එක කකුලයි. ඒ හින්ද එවුන්දට නම පටබැඳුණලු එක් පයක් ඇති ඇපා කියල. දිවි හිමියෙන් කොරාපු රාජකාරියට ගරු නම්බුවක් හැටියට යුද්දෙන් පස්සෙ රජ්ජුරුවො උන්දට වලක් ඔප්පු කරල තියෙනව පඬුරට. ඒ කිව්වේ මේ කැලෑවෙන් ම කොටහක් තෑගි කොරල තියනව. ඒක ගම්වරයක්. ඉතිං ඒකට පටබැඳුණලු එක් පයක් ඇති ඇපාට හිමි වල කියල. පස්සෙදි ඒක, 'එක් පා ඇපා වල' වෙච්චි. ඊට පස්සෙං පහු තමයි අපේ උන්දල එක් -පා-වල එප්පාවල කියල දිවේ හුරුවට නම හදාගෙන තියෙන්නේ.

මේ පිළිබඳ පටබැඳුණු තවත් ප්‍රවාදයක් වෙයි. එනම්, මේ ගමේ වැව මැද විශාල ගල් දෙකකි. ඒවා මහ ගල හා කුඩා ගල ලෙස ගැමියෝ හැඳින්වූහ. දැනට අවුරුදු සිය ගණනකට පෙර මේ පර්වතයන් ගැමියන්ගේ ජීවිතවලට බොහෝ සෙයින් බලපෑම් කරන්නට වූ බව සමහරෙකුගේ විශ්වාසය යි. එය වෙස්වලාගත් දේව ආත්මයක් කොට සලකා මහත් භක්තියෙන් යුතුව ඒ ගැන කතා කළ අය ද එකල මේ ගමේ වූ බව කියැවේ. මේ මහා ගල් පර්වත දවසින් දවස විශාල වන විලාසයක් ගැමියන් දැක ඇති බවත්, එහි අද්භූතභාවයට බිය වූ ඔවුන් ක්‍රමයෙන් ඒ ගම අතහැර යන්නට වූ බවත් කියැවේ. මෙලෙස එපාවෙලා ගිය වල එප්පාවල ලෙස නම් කෙරුණු බව ඔවුහු කියති. නමුත් ඒ අදහස ගැන තවත් අයෙක් කියන්නේ මෙසේ ය.

කතන්දරේ කොයි ආකාරෙට ගෙතිල තිබුණත් කැලේ කොළේ එක්ක යුද්ද කරල, මහපොළව පෙරළල, හතා හීපාව මෙල්ල කොරාන හිටි සද්ද විද්ද පරම්පරාවෙ උං ගලක් ලොකු වෙනවයි කියල පැනල දුවපු එක නං නිච්චියට ම කියන්ඩ අමාරුයි. ඕක නං කාගෙ හරි හතරවරං බින්නෙයක් වෙන්ඩෑ ආයිබෝං

ඉතිහාසය පිරික්සුමේ දී දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ ඒ අවට වූ ගම්මාන කිහිපයක් එකිනෙකට අදාළ සමාජ වෘත්තීන් වෙනුවෙන් වෙන්ව තිබූ බව කි. ආචිරියාගම, තම්මැට්ටාගම, රදාගම, යකල්ලාගම, ඉහළ යකල්ලාගම, නිකවැව ආදි ගම්මාන ඉන් කිහිපය කි. ඒ එකිනෙක ගම්මානවල එකල පදිංචිව සිටියෝ බෙර වයන්නෝ වූහ. කම්මල්කරුවෝ වූහ. එසේත් නැතිනම් කුඹල් වැඩකරුවෝ හෝ රෙදි සෝදන්නෝ වූහ. එසේත් නැත්නම් ඉවුම් පිහුම් කරන්නෝ වූහ. නමුත්, මේ වනවිට එම තත්ත්වය සපුරා වෙනස් වී ඇති බව අවධාරණය කළ යුතු ය. මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය ත් මෑතකාලීන සංකීර්ණ සමාජ සම්ප්‍රදායයන් මුළුමනින් ම පාහේ වෙනස් කොටගෙන තිබීම විශේෂත්වය කි. රජරැටියා උගත්කමින්, බුද්ධිමත්බවින් මෙන්ම සමාජ පරිඥානයෙන් පෝෂණය වෙත් ම, ඔවුන් අතර තිබූ පටු සමාජාකල්ප ඉවත් කරන්නට මැළි වූයේ නැත. අපි කවුරු කවුරුත් මිනිස්සු ලෙස සිතන්නට තරම් ඔවුහු දියුණු වූහ. නුවර කලාවියේ ගැමි ගොවියන් රටට පූර්වාදර්ශ සැපයූ මිනිස් පරපුරක් වූයේ එපරිද්දෙන් ද වෙයි.

මෙම ගම්මානවල ඇදහිලි ක්‍රම විවිධ ය. ඇදහිලි ක්‍රම හා සම්බන්ධ පුවත් ඉතා රසවත් ය. මුළුමනින් ම සිංහල බෞද්ධ ජනතාවක් ලෙස සමානත්වයක් දක්වුව ද දේව ඇදහිල්ලෙන් එහි විසම බවක් ප්‍රකට කරයි. කිරි අමුණුකොළේ අයියනායක දේවාලය හා සම්බන්ධ වූ පුවත් ඒ අතර කැපී පෙනේ. එක්තරා ප්‍රකට කෝල්මුර කවියකට අනුව, අයියනායක දෙවියන් එප්පාවල පසු කරමින්

**අපේ රටේ බොහෝ ගම්වලට නම හැදුණු හැටි පිළිබඳ රසවත් කතා ජනශ්‍රැතියේ එයි. ඒ ඇතැම් කතා ඓතිහාසික පුරාවෘත්ත සමඟ මෙන්ම තවත් ඒවා ගැමි තොරතුරු සමඟ ද බැඳී පවතී. ඒ කවර කතාවක් වුව එක් අතකින් ඉතා රසවත් වන අතර තවත් අතකින් ගමේ ඉතිහාසය පිළිබඳ නව තොරතුරු ද අපට හෙළි කරයි.**

අමුණුකොලේ ට වැඩි බව පැවසේ

එප්පාවල පසු කරමින් - අමුණුකොලේ වැඩ සිටලා.......

මුළු ගම්මානය ම අදහන අයියනායක දේවාලය පිහිටියේ මෙහි ය. එහි බොහෝ සෙයින් හාස්කම් පවතින බව ගැමියන්ගේ විශ්වාසය වී තිබිණි. දේවාල භූමියෙන් ගෙනා පස් ස්වල්පයක් නළලේ හා ඇගේ උලා දේවාශිර්වාදය පැතූ ගැමියන් මේ අතර වූ බව කියැවේ. ඈත ප්‍රදේශවලින් පවා වරම් ගන්නට, පිහිට ගන්නට බොහෝ අය මෙහි පැමිණ ඇත. අමුණුකොළේ වෑ කන්ද පාවුල පිහිටා ඇති මේ දේවාලය හරහා මුල් කාලයේ දී නල්ලමුදාව, මාවතවැව, කෝඩාරිකුලම හා තිඹිරියාව වැනි ගම්මාන කරා යන මාර්ගය වැටී තිබුණු නිසා මෙය වඩාත් ප්‍රසිද්ධියට පත්ව තිබූ වග විශ්වාස කළ හැකි ය.

අයියනායක, වඳුරුකාලී, භද්‍රකාලී වැනි දෙවියන් මෙහිදී ආරූඪ කොටගත් බව ත්, විවිධ ලෙඩට දුකට පිහිට ලබාදුන් බව ත් අසන්න ලැබිණි. ඇස් රුදා හැඳුණු දරුවන්, ආරූඪ වූ තැනැත්තා අතට ගෙන රෝගී දරුවාගේ ඇස්වල ඇති කබ වැනි අපිරිසිදු විස කොටස් හොඳ හැටි උරා බොන බව ත්, සැනෙකින් දරුවා සුවය ලබන බව ත් ගැමියෝ අත්දැකීමෙන් දන සිටිය හ.

අප එහි යන විට එහි කපුරාල හෙවත් ඇනමිතිරාල මියගොස් වසර ගණන කි. එබැවින් දේවාලය වසා තිබිණ. එම තනතුර කවරකුට හෝ සුදුස්සකුට පමණක් දෙවියන් විසින් ලබාදෙන වරමක් බැව් ගැමියෝ විශ්වාස කරති.

ඕකෙ හිටියෙ කපුරුබණ්ඩ උන්දෑ, උන්දෑ මළාට පස්සෙංපහු දේවාලෙ වැහුව. උන්දෑ විතරක් නෙවේ.. තවත් කැපකාරයො එක්කාසු වෙනව. ඒ කිව්වෙ බෙරකාරයො, කෝල්මුර කාරයො, ආවතේවකාරයො වගේ අය. ඇත්දත් පනාව එක්කෙනෙක් ළඟ, පට ලේන්සුව එක්කෙනෙක් ළඟ, නලාව, අඹගෙඩි මාලෙ තවත් අය ළඟ. ඇනමිතිරාල නං කෙරුවට පස්සෙංපහු ඔය හැම කෙනෙක් ම එක්කාසු වෙනව දේවකාරියට.

ගැමියන් විසින් කියන ලද කෝල්මුර කවිවලට අනුව අයියනායක දෙවියන් නාථ දෙවියන් ලෙස විශ්වාස කරන ඔවුහු, ඒ නිසා ම උන්වහන්සේ මතු බුදු වන මෛත්‍රී බුදුන් ලෙස ද විශ්වාස කරති.

ඈත පෙරුමන් පුරාගෙන - මෛත්‍රී බුදුවර පතා එන

නාථ දෙවිරජු සාමිනේ- අපට අවසර දෙනු මැනේ.....

එප්පාවල වැවේ, වෑ කන්දේ මහා ගල්කුළේ ඇති අලියකුගේ හා කුල්ලක රූ සටහන් පිළිබඳව ද ගැමියෝ විවිධ අදහස් දරති. ඇතෙක් බරට රන්, රිදී, මුතු, මැණික් වස්තුව එහි නිදන් කොට ඇති බව ත්, සාලිය කුමරු ගේ රාජාභරණ සහිත ඇඳුම් කට්ටලය මෙහි සඟවා ඇති බවත් සමහරු කියති. කරුණු කෙසේ වුව ද ගැමියා වාසනාවන්ත ය. ඒ මන්දයත්, සුපිරිසිදු සංස්කෘතියක මුල් ගම්බිම් අදත් ඔවුන් සතුව පවතින බැවිනි. ඒ ගැන තොරතුරු කතා කිරීම ම රසය දනවන්නක් වන්නේ ඇයි? සැබැවින් ම ඒ අපේ ම - වංහු බැවිනි ■

## මහ අහස යට

# නුඹ

මගෙ චන්දිරා
නුඹ පෙම්බරා
ඇසි දිය ගඟේ ගහගෙන ගියා
මගෙ චන්දිරා නුඹ පෙම්බරා

කෙත පුරන් වී නම් කුරුල්ලෝ
සැඟවී නොයා දෝ දුර බොහෝ
කිහිරඟුරු වී ඇවිලෙන ලොවේ
මහ අහස යට නුඹ තනිව දෝ

පුර පස සඳේ කැළලක් තියේ
එය ආකහේ තවමත් දිලේ
මගෙ චන්දිරා අහපත් දුවේ
අව අටවකයි දූන් ජීවිතේ...

වසන්ත බණ්ඩාර දිසානායක

# පව්

අබා වැව් දියට වගුරා මකරන්ද
නිදාගත් නෙළුම් ඇති නොබිඳ ම නින්ද
වැවේ හද මැද ම මහ සෑ රුව ඇන්ද
හඳේ නුඹට බැස යන්නට පුළුවන්ද

අවර පත්ව නුඹ නික්මෙන කල අරුණේ
මහබෝධියේ පත් දුර මළුවක තිබුණේ
සෙවණලු අමදින පින්සර සැදැහැතුණේ
පව් සිදුවෙයි මහ පොළොවේ හිත රිදුණේ

ඉසුරුමුණිය ළඟ වේළුණු නියඟයට
ලා ගොයමට නෙළුම් මලට සිහිලසට
වලාහක දෙවිඳු ඉසිවර ඇස අඟට
තබා පිනි බින්දු බැස ගිය හැකි නුඹට

රත්න ශ්‍රී විජේසිංහ